සිරි පොඳ වැස්සෙන් තෙත බරිත ගහ කොළ මත සඳ එළිය වැටී ඇති අයුරු කාමරයේ ජනේලය තුළින් නිෂාධිට පෙනෙයි. වේලාව රාත්‍රී දොළහත් පසුවී ඇති බව ඇයට විශ්වාස ය. දැනවල් නිවසින් ගිය දිලීප තවමත් නොපැමිණීම ඇගේ සිතට බියක් එක් කළේ ය. ඔහු කිසි දිනෙක මේ තරම් පමා වී පැමිනි බවක් ඇයට මතක නැත. සමහර දිනෙක යහලුවන් හා සාදයකට යන නමුදු ඒ සෑම දිනෙකම ඇයට ඒ බව කියා යන්නට ඔහු අමතක නොකළ බව ඇයට සිහිපත් විය.

ඔහු ගියේ මහත් කැළඹුණ සිතින් ය යන කරුණ ඇගේ සිතේ බිය තවත් වැඩි කළේ ය. සවස අනුරාධ හා කතා කිරීමෙන් සිතේ ඇතිවුණ සතුට ක්‍රමයෙන් වියැකී යන්නාක් මෙන් ඇයට දැනෙයි.

දරාගත නොහැකි පාලුවක් ඇයට දැනුණි. මේ මොහොතේ අනුරාධ මෙතැන සිටියා නම්... එකම ආදරණීය බැල්මකින් එකම ආදරණීය වදනකින් සිත සන්සන්නට අනුරාධ මෙතැන සිටියා නම්... සුසුම් හෙළනු හැරෙන්නට කරන්නට වෙන යමක් තිබේදැයි ඇය නොදත්තා ය. සුබදායක හෙටක් උදාවනු ඇතැයි යන බලාපොරොත්තුව පමණක් සිත දරාගෙන ජීවිතයට මුහුණ දිය යුතු ය.

නිෂාධි ඇඳෙන් නැගිට විත් තේ කෝප්පයක් සාදා ගත්තා ය. රූපවාහිනිය ක්‍රියාත්මක කළ ඇය දිග සෝපාවේ ඇළවී අරමුණකින් තොරව එදෙස බලා සිටියා ය. දිලීප ගේ ජංගම දුරකතනයට ඇමතුමක් ගන්නට කීප විටක්ම සිතුණ ද ඇය ඒ සිතුවිල්ල යටපත් කොට ගත්තා ය.

ගතේ තෙහෙට්ටුව කිසා තවත් පැය බාගයක් පමණ ගත වන විට නිෂාධි සෝපාව මතම නින්දට වැටී සිටියා ය.

00000

සඳලි හා ගතකළ සැන්දෑව දිලීප ගේ සිත මහත් සැහැල්ලුවට පත් කොට තිබුණි. සම්පූර්ණ දර්ශනය පුරාවටම ඇය සිටියේ ඔහුගේ අතේ එල්ලීගත් වනම ය. කීප වතාවක්ම ඇගේ අත සීරුවෙන් ඉවත් කරන්නට ඔහු උත්සාහ කළ ද ඇඳ එය නොදැනුණාක් මෙන් සිටියා ය.

''මොකද මේ බබෙක් වගේ..? මම ඔයාගෙ අතින් අල්ලගෙන ඉන්නවා විතරයි.. හිතෙන් අල්ලගන්න හදන්නෙ නැහැ..'' ඔහු ඇගේ අත ඉවත් කරන්නට උත්සාහ කළ අවසන් වතාවේ ඇඳ ඔහුගේ කනට ළං වී කීවා ය.

මතක ඇති කාලයක හින්දි සිනමා පටයක් නොබැලූ දිලීපට මුලු ප්‍රසංගයම හිරිහැරයන් සේ දැනුණි. හින්දි සිනමාවේ ආරම්භක යුගයේ සිට වර්තමානය දක්වා සංගීතයේ විකාශණය ඔහුට ග්‍රහණය කරගන්නට නොහැකි විය. එනිසාම ප්‍රසංගයේ කිසිදු රසයක් ඔහු නොවින්දේ ය. ඔහු කළ එකම දෙය ගල් රුවක් සේ ඒ දෙස බලා සිටීම පමණකි ය.

උදෑසන සිදුවූ සියල්ල කිසිදාක නොවුණා සේ සිත රවටා ගන්නට ඔහු ඒ අතර උත්සාහ කරමින් සිටියේ ය. නිෂාධිට කිසි ලෙසකින් වත් දරුවකු ලැබෙන්නට හැටියක් නැත. ලැබුණ ද ඒ දරුවා වෙන කිසිවකුගේ විය නොහැකි ය. මේ සියල්ල සිහිනයක් සේ යයි ඔහුට දැනෙයි. කිසිදිනෙක සිහිනෙන් වත් නොපැතූ ලෙස විනාශයක් සිදුවී ඇති බව සැබෑ ය. එය සත්‍යය යයි කෙළෙස පිළිගන්න ද?

අද දවස ප්‍රශ්නයක් වූවා සේ ම හෙට දවස අවිනිශ්චිත එකක් වනු නියත ය. මේ අවිනිශ්චිත හෙටට කෙසේ මුහුණ දෙන්නදැයි ඔහුට නොවැටහෙයි. හෙට උදයේ සිට නිෂාධි ගේ මුහුණ දෙස කෙළින් බලන්නට හැකියාවක් තමාට නොලැබෙනු ඇත.

දිලීප ප්‍රසංගය රස නොවින්ද බව සඳලි ද දැන සිටියා ය. ඇය කීප වතාවක්ම එක් එක් දර්ශණ ඔහුට පැහැදිලි කර දෙන්නට උත්සාහ කළ නමුදු ඔහුගේ අවධානය තිබුණේ වෙනතක බව වටහා ගත් පසු ඒ උත්සාහය අතහැර දැමුවා ය.

''ඔයා නම් හරිම ගල් බමුණෙක්..'' ඉවසා සිටිනු බැරිම වූ මොහොතේ ඇඳ ඔහුගේ කනට කර කීවා ය. ''.. කිසිම රස වින්දනයක් දන්නෙ නැති මෝල් ගහක්.. මෝ එක රස විඳින්න බැරි නම් අඩුම ගානෙ මේ තමන් ළඟ වාඩි වෙලා දැවටෙන්නෙ ලස්සන කෙල්ලෙක් නේද කියන එකවත් මතක වෙන්නෙ නැති මැටි ඔළුවක් ඔයාට තියෙන්නෙ..''

ඔහු කිසිවක් නොකියා සිනාසෙණු ඇය අඩ අඳුරේම දුටුවා ය.

''පුදුමයක් නැහැ නිෂාධි නළුවෙක් එක්ක සෙට් වුණ එක..'' ඇඳ නැවත කීවා ය.

''පිස්සු කතා කියන්න එපා..'' ඔහු කීවේ ය.

''පිස්සු ඔයාටනේ.. ඒකනේ දවල් කාමරේ දොරවලුත් වහගෙන මහා කල්පනාවක වැටිලා හිටියේ.. මේ අහන්න මහත්තයා.. ඔයා දැන් ඉන්නෙ මහා ලොකු අවුලක..''

දිලීප අපහසුවෙන් වට පිට බැලුවේ ය. සන්දර්ශණයක් මැද කතා කර අවට සිටින්නන්ට බාධා කරන්නට ඔහු නොසිතුවේ ය.

''අපි පස්සෙ කතා කරමු..'' ඔහු කීවේ එනිසා ය. සඳලි ඉදිරිය බලා ගත්තේ නොරිස්සුම පිට කිරීම උදෙසා ඔහුගේ අත ද කොනිත්තාගෙනම ය.

''හිතේ කරදරයක් තියෙනවා නම් ඒක කාට හරි කියන්න... එතකොට හිත සැහැල්ලු වෙනවා..'' ආපසු එන අතර ඇඳ කීවා ය.

''අනුන්ගෙ කරදර ඔයා මොකටද ඔයාගෙ ඔළුවට දාගන්නෙ..?'' ඔහු සිනාසුණේ ය.

''හැමෝගෙම කරදර දාගන්නෙ නැහැ මං ... ඒත් ඔයාගෙ කරදර නං දාගන්න අකමැත්තක් නැහැ.. වෙන මොකක-ටවත් නොවෙයි.. ඔයාට උදව්වක් හැටියට..''

''උදව්වක් හැටියට...'' ඔහු ඇගේ වචන පුනරුච්චාරණය කළේ ය. ''.. මං හිතන්නෙ මට එහෙම උදව්වක් ඕනෙ නැහැ කියලයි..'' ''ඔයා මහා ගල් මිනිහෙ-ක්...'' අමන්දි සිය නවාතැන ඉදිරියේ දී කාරයෙන් බසින අතර කීවා ය. ''.. ඒත් මොකක්දෝ හේතුවක් නිසා මං ඔයාට ගොඩක් කැමතියි..'' ඔහු සිනාසෙන්නට උත්සාහ කළේ ය.

''එන්නැද්ද ඇතුළට තේ එකක් බීලා යන්න..?'' ඇඳ නැවත කාරය තුළට එබී බලා ඇසුවා ය.

''තෑන්ක්ස්.. මම ඉක්මනට යන්න ඕනෙ..'' ඔහු කීවේ ය. ඇය සිනාසුණා ය. ඒ සිනාවේ ගැබ්වුණ උපහාසය ඔහු තේරුම් ගත්තේ ය. ''.. ඇතුළට ඇවිත් තේ එකක් බොන්න අකමැත්තක් නැහැ.. ඒත් අද මං ඉක්මනට යන්න ඕනෙ''

නිවස තුළ තවමත් විදුලි පහන් දැල්වෙන අයුරු කාරය වත්තට ඇතුල් කරද්දීම දිලීප දුටුවේ ය. නිෂාධි තවමත් නින්දට ගොස් නැතිවා සේ ය.

දිලීප දොර ඇරියේ ශබ්ද නොනැගෙන්නට ය. නිෂාධි සෝපාවේ නිදා සිටිනු ඔහු දුටුවේ ය. කාමරයට යන අදහස අත්හරගත් ඔහු ඇය ඉදිරියේ වාඩි වූණේ ය. ඇගේ සුන්දර මුහුණ දෙස බලා සිටියේ ය. ඇගේ නළලත මත හාදුවක් තැන්පත් කරන්නට ඔහුගේ සිත බල කළේ ය. එනමුදු එකම එක සිතුවිල්ලක් ඔහු පසුබස්වන්නට සමත් විය. ඇඳ තව දුරටත්

තමාගේ නොවේ ය. ඒ සියලු අයිතිවාසිකම් අවසන්ව ඇත්තේ ය. දැන් ඉතිරිව ඇත්තේ ලෝකයට පෙනෙන්නට කළ යුතු රඟපෑමක් පමණක් ය.

රෝස මල් පිපෙන්නට වෙර දරන
මේ නිහඬ රාත්‍රිය නුඹට ම ය
මා දෑස මත රැඳුණ මේ කඳුළ
පමණක් ම දැන් ඉතින් මට හිමි ය....

තුහින සිසිලස වැදී මල් පියලි
දැව් දැව් මිලින වන අරුම පැය
එළැඹුණේ මන්ද මේ සිසිරයේ
ජීවිතේ කිසිදාක නොපැතූ ලෙස....

තමා කොපමණ වේලාවක් ඇඳ ඉදිරියේ වාඩි වී සිටියාදැයි දිලීප නොදැන සිටියේ ය. තවමත් ක්‍රියාත්මක වෙමින් තිබුණ රූපවාහිනිය නිවා දැමූ ඔහු කාමරයෙන් පොරෝනාවක් ගෙනැවිත් ඇයට පෙරෙවිවේ ය.

ඇඳ සිය විජිතයේ රැජින ය. ඇයට රිසි සේ ඉගිල යන්නට ඉඩ නොදිය යුතු ය. ඒ වෙනුවෙන් කොපමණ මිලක් ගෙවන්නට සිදු වුව ද එය ගෙවන්නට දිලීප සූදානම්ව සිටියේ ය.

0000000

නිෂාධි අවදි වුණේ කිසිවකු තේ සාදන ශබ්දයෙනි. සෝපාවේ ඇළවී ගත්වන ම ඇඳ හිස ඔසවා බැලුවා ය. ඇයට පිටුපා පැන්ට්‍රිය අසළ තේ සාදමින් සිටි දිලීප ඇඳ දුටුවා ය.

ගතට තෙහෙට්ටුවක් දැනෙයි. නිෂාධි යළි ඇසි පියා ගත්තා ය. රෑ මෙතැනට එන විට පොරෝනයක් ගෙන ආ බවක් ඇයට මතක නැත. මෙය පොර-වන්නට ඇත්තේ දිලීප විය යුතු ය. එය ඇගේ සිතට මහත් බරක් විය. ඔහු මෙසේ තමා කෙරෙහි සැළකිලිමත්වීම ඇගේ සිත කරදරයට පත් කළේ ය. ඇත් විය යුතු මොහොත එළැඹ තිබියදී ඔහු ළං වන්නට උත්සාහ කරයි.

දිලීප ළඟට එන පියවර හඬ ඇයට ඇසුණි. ටීපෝව මත තේ කෝප්පය තබන හඬද ඇයට ඇසුණි.

''නිෂා... ඔයා නැගිටලා නේද..?'' ඔහු සිහින් හඬින් අසනු ද ඇයට ඇසුණි. නසුණා සේ ඇස් පියාගෙන ඉන්නට ඇයට සිතුණි. සියුම් කෝපයක් සිත තුළ මෝදු වෙයි. විවාහ වී මේ තාක් කාලයක් තේ කෝප්පයක් නොසෑදූ මිනිසා ගේ මේ වෙනස ඇගේ සිතේ ඇති කළේ නුරුස්සා හැරීමකි. ඔහු බොහෝ ප්‍රමාද ය. ඒ බව කෑ ගසා කියන්නට ඇයට සිතෙයි. දැන් වේගයෙන් දුව පසුගිය කාලය අල්ලා ගන්නට ඔහුට නොහැකි ය. ඒ බව ඔහුට නොතේරේම පුදුමයකි. ඔහු රෑ නිදිවරා කියවන බරසාර පොත් පත් වල ජීවිතය පිළිබඳ හෝ ගැහැණිය පිළිබඳ හෝ කරුණු කාරණා ලියැවී නැති බව නිසැක ය. එසේ තිබුණා නම් මේ සිදුවෙමින් තිබෙන පරිවර්තනය ඔහු පහසුවෙන් තේරුම් ගනු ඇත. ඔහු ඉතා පහසුවෙන් එයට හුරු වනු ඇත.

''තේ එක බොන්න..'' ඔහු කීවේ ය.

නිෂාධි නැගිට සෝපාව මත වාඩි වූවා ය.

''මම එනකොට ඔයා මෙතන නිදි.. නැගිට්ටවන්න ලෝබ හිතුණා..'' ඔහු ඇය ඉදිරියේ වූ පුටුවේ වාඩි වන අතර කීවේ ය.

තේ කෝප්පය තොල ගාමින් ඔහු ඇය දෙස බලා සිටියේ ය. අතීතයේ දී ඇගේ මුහුණේ වූ ආදරණීය බැල්ම සොයා ගත නොහැකිව ඔහු තැවුණේ ය. ඒ ආදරණීය සිනාව වියැකී ගොස් ඇත. ඇඳ ගල් රුවක් සේ වාඩිවී ගත් වනම නොසෙල්වී සිටියා ය. ඔහුගේ මුහුණ දෙස නොබලා ඉවත බලාගත්වන ම සිටියා ය.

''තේ බොන්න'' ඔහු නැවත කීවේ ය. නිෂාධි අකැමැත්තෙන් ම කෝප්පය අතට ගත්තා ය. එක උගුරක් බීවි සැණින් ඇය කෝප්පය නැවත තැබුවා ය.

''රස නෑ නේද..?'' ඔහු ඇසුවේ ය. ඇඳ කිසිවක් නොකීවා ය. ''.. ඔයා මුණ සෝදලා ලැහැස්ති වෙලා එන්න.. අපි දවල් කෑමට එළියට යමු.. මං අද යුනි යන්නෙ නැහැ.. මට ඔයා එක්ක ටිකක් කතා කරන්න ඕනෙ''

නිෂාධි පළමු වරට ඔහු දෙස එක එල්ලේ බැලුවා ය.

''කියන්න තියෙන දෙයක් අපි මෙහෙදි කතා කරමු..'' ඇඳ කීවා ය. ''..මං කැමති නැහැ කොහෙවත් යන්න..''

ඔහු ඇය දෙස තියුණු බැල්මක් හෙලුවේ ය. තමාගේ මුරණ්ඩු කම ඔහු කෝප ගන්වනු ඇති බව ඇය දැන සිටියා ය. එනිසා ඇගේ සිතේ තැති ගැන්මක් ඇති වූයේ නැත. ඔහු විනාඩි කීපයක් නිහඬව තේ

ඔහු රෑ නිදිවරා කියවන බරසාර පොත් පත් වල ජීවිතය පිළිබඳ හෝ ගැහැණිය පිළිබඳ හෝ කරුණු කාරණා ලියැවී නැති බව නිසැක ය. එසේ තිබුණා නම් මේ සිදුවෙමින් තිබෙන පරිවර්තනය ඔහු පහසුවෙන් තේරුම් ගනු ඇත.